# මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA



සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021.12.16 |


## පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.)[1] – 2020

**COVID-19 වසංගතය පැතිරීම මධ්‍යයේ, බස්නාහිර පළාත ආර්ථිකයේ කේන්ද්‍රස්ථානය ලෙස අඛණ්ඩව පැවති අතර සමස්ත ආර්ථිකයේ සිදු වූ පසු බෑම කෙරෙහි එහි දායකත්වයේ අඩු වීම ද හේතු විය.**

**විශේෂ කරුණු**


*නාමික ද.දේ.නි- 2020*
*රු. බිලියන 14,973.0*

*ප.ද.දේ.නි දායකත්වය ඉහළම අගය:*
*බස්නාහිර පළාත*

රටේ නාමික දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) ඉහළම දායකත්වය (සියයට 38.0) බස්නාහිර පළාත විසින් ලබා දී ඇත. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන්, එහි දායකත්වය 2019 වසරේ සිට සියයට 1.0 කින් අඩු වී ඇත. මධ්‍යම පළාත (සියයට 11.3) සහ වයඹ පළාත (සියයට 11.0) පිළිවෙලින් දෙවන සහ තෙවන ඉහළම දායකත්වයන් ලබා දී ඇත.

වයඹ, දකුණ, සබරගමුව සහ උතුරු මැද පළාත්වල දායකත්වයන්හි ඉහළ යාමක් සිදු වී ඇති අතර බස්නාහිර සහ උතුරු පළාත්වල දායකත්වය පෙර වසරට සාපේක්ෂව අඩු වී ඇත.

**රූප සටහන 1**
**පළාත් අනුව ද.දේ.නි. දායකත්වය (%) - 2020**




**සංඛ්‍යා සටහන 1**
**පළාත් අනුව නාමික ද.දේ.නි**

| පළාත | 2019 (අ) | | 2020(ආ) | |
|---|---|---|---|---|
| | අගය (රු. බිලියන) | ප්‍රතිශතය (%) | අගය (රු. බිලියන) | ප්‍රතිශතය (%) |
| බස්නාහිර | 5,857.8 | 39.0 | 5,694.3 | 38.0 |
| මධ්‍යම | 1,694.6 | 11.3 | 1,692.1 | 11.3 |
| වයඹ | 1,639.6 | 10.9 | 1,653.1 | 11.0 |
| දකුණු | 1,491.4 | 9.9 | 1,518.0 | 10.1 |
| සබරගමුව | 1,131.1 | 7.5 | 1,188.2 | 7.9 |
| උතුරු මැද | 823.3 | 5.5 | 876.3 | 5.9 |
| නැගෙනහිර | 854.1 | 5.7 | 849.4 | 5.7 |
| ඌව | 803.5 | 5.4 | 812.1 | 5.4 |
| උතුරු | 717.6 | 4.8 | 689.4 | 4.6 |
| **ශ්‍රී ලංකාව** | **15,013.0** | **100.0** | **14,973.0** | **100.0** |

(අ ) සංශෝධිත (ආ) තාවකාලික

## ආර්ථික කටයුතු අනුව ක්‍රියාකාරිත්වය

### ආර්ථික කටයුතු සඳහා පළාත් දායකත්වය


සෑම පළාතක්ම පාහේ කෘෂිකාර්මික කටයුතු සඳහා සැලකිය යුතු ලෙස දායක වී ඇති අතර එම දායකත්වය සියයට 7.7 සිට සියයට 17.6 දක්වා පරාසයක විහිදේ. ඒ අතරින්, වයඹ, දකුණු, සහ මධ්‍යම පළාත්, කෘෂිකාර්මික කටයුතු වලට ඉහළම දායකත්වය සපයා ඇත (රූප සටහන 2).

සියයට 44.6 ක දායකත්වයක් සපයමින් කර්මාන්ත කටයුතු සඳහා ප්‍රමුඛ දායකත්වය ලබා දීමට බස්නාහිර පළාත සමත් වී ඇති අතර, මධ්‍යම සහ වයඹ පළාත් පිළිවෙලින් දෙවන සහ තෙවන ඉහළම දායකත්වයන් සපයා ඇත.

සේවා කටයුතුවල ඉහළම දායකත්වය වන සියයට 39.3 බස්නාහිර පළාත විසින් ලබා දී ඇති අතර, මධ්‍යම සහ දකුණු පළාත් පිළිවෙලින් දෙවන සහ තෙවන ඉහළම දායකත්වයන් සපයා ඇත.

පසුගිය වසරට සාපේක්ෂව, ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වයේම දායකත්වයන්හි වර්ධනයන් ලබා ගැනීමට සමත් වී ඇත්තේ සබරගමුව පළාත පමණි. බස්නාහිර පළාත පෙර වසරට සාපේක්ෂව සියලු ආර්ථික කටයුතු වල දායකත්වයන්හි පසුබෑමක් පෙන්නුම් කරන අතර, අනෙකුත් පළාත් මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරයි (සංඛ්‍යා සටහන 2).

**රූප සටහන 2**
**පළාත් අනුව ආර්ථික කටයුතුවල ප්‍රතිශත දායකත්වය -2020**




**සංඛ්‍යා සටහන 2**
**පළාත් අනුව නාමික ද.දේ.නියෙහි ආංශික සංයුතිය - 2019 and 2020**

| පළාත | කෘෂිකර්මාන්ත (%) | | කර්මාන්ත (%) | | සේවා (%) | |
|---|---|---|---|---|---|---|
| | 2019 | 2020 | 2019 | 2020 | 2019 | 2020 |
| බස්නාහිර | 9.6 | 8.1 | 45.6 | 44.6 | 39.7 | 39.3 |
| මධ්‍යම | 10.8 | 12.0 | 11.3 | 11.4 | 11.3 | 11.1 |
| දකුණු | 15.9 | 14.3 | 6.9 | 7.7 | 10.6 | 10.6 |
| උතුරු | 9.8 | 8.8 | 5.2 | 4.8 | 3.9 | 3.9 |
| නැගෙනහිර | 10.5 | 10.2 | 4.7 | 4.4 | 5.5 | 5.6 |
| වයඹ | 17.2 | 17.6 | 9.9 | 10.3 | 10.6 | 10.5 |
| උතුරු මැද | 9.0 | 11.9 | 3.5 | 3.4 | 6.0 | 6.1 |
| ඌව | 9.5 | 9.6 | 5.2 | 5.0 | 4.9 | 5.1 |
| සබරගමුව | 7.7 | 7.7 | 7.6 | 8.5 | 7.5 | 7.7 |
| **ශ්‍රී ලංකාව** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** | **100.0** |

[1] ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත් කරනු ලබන නාමික දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) , සුදුසු දර්ශක යොදා ගනිමින් පළාත් අනුව වෙන්කර සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ප.ද.දේ.නි. ඇස්තමේන්තු කර ඇත.

## පළාත් තුළ ආර්ථික කටයුතු

සියලුම පළාත් සේවා කටයුතු සඳහා සියයට 50 කට වඩා වැඩි දායකත්වයක් ලබා දී ඇත. සියලු පළාත්වල කර්මාන්ත කටයුතු වල දායකත්වය සේවා කටයුතු වල දායකත්වයට පමණක් දෙවැනි වන අතර එය සියයට 15.1 සිට සියයට 30.8 දක්වා පරාසයක විහිදේ. සියලු පළාත් වල කෘෂිකාර්මික කටයුතුවල දායකත්වය සියයට 1.8 ත් සියයට 17.0 ත් අතර අගයක් ගනියි (රූප සටහන 3).

**රූප සටහන 3**
**පළාත් තුළ ආර්ථික කටයුතු -2020**

